**රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල - 2017**

-----------------------------------------------------------------

රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් ලැබීම් හා ගෙවීම් පිළිබඳ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

(අ) අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව පිළියෙල කර ඇති බව වාර්තා කර තිබුණද, ප්‍රමිතයට පටහැනි ලෙස දෙපාර්තමේන්තුව විසින් පනවන ලද දණ්ඩන හා රාජසන්තක කිරීම් මුදල් පදනමට ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කර තිබුණි.

(ආ) ප්‍රමිතයේ 21 (ඇ) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් සමඟ ඉදිරිපත් කළ යුතු සංරචකයන් අතරින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය එක් සංරචකයක් වුවත් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුළ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ප්‍රමිතයේ 21 (ඉ) ඡේදය ප්‍රකාරව අස්තිත්වයක අනුමත අයවැය ලේඛනයේ අඩංගු සංඛ්‍යා, තථ්‍ය සංඛ්‍යා සමඟ සසඳා වෙනම තීරුවක හෝ වෙනම මූල්‍ය ප්‍රකාශයක් වශයෙන් දැක්විය යුතු වුවත්, අයවැය ලේඛනයේ සංරචකයන් හා මූල්‍ය ප්‍රකාශනවල සංරචකයන් අතර ගැළපීමක් නොවීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ අයවැය ගත තොරතුරු අනාවරණය කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට විමර්ශන කටයුතු අවසන්ව තිබූ සිද්ධි ලිපිගොනු 64 කට අදාලව පනවා තිබූ රු.1,021,654,862 ක දඩ මුදල්වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අයකර ගෙන තිබූ රු. 451,553,540 ක මුදලින් සියයට 50 ක් ලෙස රේගු ත්‍යාග අරමුදලට ලැබිය යුතු රු. 225,776,770 ක ප්‍රමාණය හා තවදුරටත් ලැබිය යුතු රු. 570,101,322 ක දඩ මුදලින් සියයට 50 ක් ලෙස ත්‍යාග අරමුදලට ලැබිය යුතු රු.285,050,661 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) රේගු ආඥා පනතේ 153 වගන්තිය අනුව දණ්ඩන හා රාජසන්තක කළ භාණ්ඩ විකුණුම් ආදායමෙන් රේගු ත්‍යාග අරමුදල සඳහා සියයට 50 ක්ද, කළමනාකරණ හා වන්දි අරමුදල සඳහා සියයට 20 ක්ද වශයෙන් දායක වුවද, කළමනාකරණ හා වන්දි අරමුදල සඳහා ආදායම් ලෙස හඳුනාගෙන තිබූ නමුත් ඊට සමානුපාතිකව ත්‍යාග අරමුදලේ ආදායම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කල යුතු රු.25,974,067 ක් ගිණුම් ගතකර නොතිබුණි.

**2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

රේගු ත්‍යාග මුදල් ගෙවීම සඳහා නිශ්චිත ත්‍යාග ගොනු සකස් කර ඒ අනුව අවශ්‍ය ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් ලබාගෙන ගෙවීම් කල පසු ත්‍යාග අරමුදලේ හා එහි උප අරමුදල්වල ශේෂයක් පැවතිය නොහැකි වුවත්, 1999 වර්ෂයේදී එසේ නොගෙවා ඉතිරිව පැවති රු.23,300,456 ක ශේෂය 2017 දෙසැම්බර් 31 දින වන විට රු.816,109,695 ක් දක්වා වර්ධනය වී තිබූ අතර, එම ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි.

**2.3 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

1969 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තිය ප්‍රකාරව ත්‍යාග අරමුදලින් ත්‍යාග මුදල් බෙදා හැරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කල යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් රේගු ත්‍යාග මුදල් බෙදා හැරීම සඳහා නිකුත් කර තිබූ 1988 ජනවාරි 28 දින අංක පීඑල් 118 දරන දෙපාර්තමේන්තු නියෝගය සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

ලබාගත හැකි වූ තොරතුරු අනුව 1999 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ පසුගිය වර්ෂ 19 ක කාලය තුළ එසේ එකඟතාවය ලබාගත් බවට තහවුරු කර ගැනීමකින් තොරව රේගු නිලධාරීන් හා තොරතුරු සපයන්නන් වෙත රුපියල් බිලියන 14 කට ආසන්න මුදලක් ත්‍යාග ලෙස ගෙවා තිබුණි. එසේ ගෙවූ රුපියල් බිලියන 14 කට ආසන්න මුදලින් පසුගිය වර්ෂ 5 තුළදී පමණක් රුපියල් බිලියන 7.07 ක් ගෙවා තිබීමෙන් අසාමාන්‍ය තත්ත්වයක් පෙන්නුම් කෙරේ. එසේම 1999 වර්ෂයේදී නිලධාරීන්ට ගෙවා තිබුණු රුපියල් මිලියන 222 ක් වූ ත්‍යාග ගෙවීම් 2017 වර්ෂය වන විට රුපියල් මිලියන 1,659 ක් දක්වා සියයට 647 කින් වර්ධනය වී තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.25,457,489 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.164,425,880 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.138,968,391 කින් පිරිහී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව අරමුදලේ ආදායම සියයට 2 කින් අඩු වී තිබියදී අරමුදලේ වියදම ද සියයට 4 කින් වැඩි වී තිබීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. කෙසේ වුවද, මෙම අතිරික්තයෙන් නිරූපණය වන්නේ ත්‍යාග අරමුදල යටතේ ඇති උප අරමුදල් තුනෙහි වැය නොකල මුදල් ප්‍රමාණය විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා එකතුව රු.8,239,471,880 ක මුදලක් නිලධාරීන් හා ඔත්තුකරුවන් අතර බෙදා හැර තිබුණද, මින් රු.7,454,724,025 ක් හෙවත් සියයට 90.47 ක් නිලධාරින් වෙත ගෙවා තිබුණි.

(ආ) 2012 වර්ෂයේදී නිලධාරීන්ට හා ඔත්තුකරුවන්ට ගෙවූ මුදල රු.මිලියන 822 ක් පමණක් වුවද, 2017 වන විට එය රු.මිලියන 1,768 ක් දක්වා එනම් සියයට 115 කින් වැඩි වී තිබුණි. ඒ අනුව රේගු බදු වංචාවන්ගේ සැළකිය යුතු පාලනයක් හෝ අඩුවීමක් සඳහා ත්‍යාග යෝජනා ක්‍රමය හේතුවී ඇති බවක් විගණනයේදී නිරීක්ෂණය නොවිණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රේගු වැරදි සම්බන්ධව සිදු කරන රේගු විමර්ශනවලදී සාමාන්‍ය ක්‍රමයට ආනයනයන් මත රජයට ලැබිය යුතු අවම බදු ආදායමේ ප්‍රමාණය අයකර ගැනීම පිළිබඳ නොසලකා එම අහිමි වූ බදු ආදායමද ඇතුළත් වන පරිදි රේගු වැරදි සම්බන්ධයෙන් දඩ පැනවීමත් එසේ පනවන දණ්ඩන මුදලින් සියයට 50 ක් නිලධාරීන්ට ත්‍යාග ගෙවීමට යෝජනා වීමත් තුළින් රජයට ලැබිය යුතුව තිබූ ආදායම අඩු වීමත්, නිලධාරීන් වෙත බෙදාහරින ත්‍යාග මුදල්වල ප්‍රමාණය වැඩි වීමත් නිරීක්ෂණය විය.

(ආ) වර්තමානයේ පවත්නා නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හේතුවෙන් ආනයනයන්ගේ හා අපනයනයන්ගේ ඇති වී ඇති සංකීර්ණතාවයට ගැලපෙන අයුරින් රේගු ආඥා පනත මෙන්ම මෙම අරමුදල්වල නෛතික ප්‍රතිපාදන විධිමත්ව හා කාලීනව සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) අරමුදල යටතේ ත්‍යාග ගෙවීම සඳහා යෝජිත රේගු විමර්ශන බොහොමයක්, භාණ්ඩවල වටිනාකම අඩුවෙන් දැක්වීම, නියමිත භාණ්ඩ වර්ගීකරණ අංකය (HS CODE) වැරදි ලෙස දැක්වීම, ප්‍රකාශ නොකර භාණ්ඩ රැගෙන ඒම, ප්‍රකාශ කළ භාණ්ඩවලට වැඩිපුර භාණ්ඩ රැගෙන ඒම, ප්‍රකාශ කළ භාණ්ඩ වෙනුවට වෙනත් භාණ්ඩ රැගෙන ඒම, ශ්‍රී ලංකාවට ආනයනය තහනම් කළ භාණ්ඩ ආනයනය කිරීම හා අපනයනය තහනම් කළ භාණ්ඩ අපනයනය කිරීම හා ප්‍රකාශ නොකළ මුදල් දිවයිනට රැගෙන ඒම සහ රැගෙන යාම යනාදී රේගු වැරදි සම්බන්ධයෙන් සිදුකර ඇති ඒවා බව නිරීක්ෂණය විය. එවැනි රේගු වැරදි වැළක්වීම සඳහා ශ්‍රී ලංකා රේගුව තුළ ස්ථාවර වැටුප් ලබන නිලධාරීන් සියලුම අංශ සඳහා යොදවා තිබියදී අඛණ්ඩව පවතින මෙවැනි රේගු වැරදි තුළින් රාජ්‍ය ආදායමට සිදුවන අහිතකර බලපෑම පාලනය කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග මේ දක්වා ගෙන ඇති බවක් නිරීක්ෂණය නොවීය.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

---------------------------------

ත්‍යාග අරමුදලේ උප අරමුදලක් වන ඉන්ධන අරමුදලට සමාලෝචිත වර්ෂයේදී රු.65,553,693 ක් බැර කර තිබුණි. එම අරමුදල පිහිටුවීමේ අරමුණු ලෙස රේගු විමර්ශන සඳහා අවශ්‍ය ඉන්ධන වියදම් පියවා ගැනීම බව දක්වා තිබුණ ද, විමර්ශන කටයුතු සඳහා දරන ඉන්ධන පිරිවැය දෙපාර්තමේන්තුවේ පොදු වැය ශීර්ෂයට වැය බරක් වී තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ එම අරමුදලෙන් කිසිදු වියදමක් දරා නොතිබුණි. එසේ වුවද සාධාරණ අවශ්‍යතාවයන් නොසලකා දිගින් දිගටම මෙම අරමුදලට මුදල් රැස්කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට එහි ශේෂය රු.440,341,560 ක් වී තිබුණි.

## 5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------------

### 5.1 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

අයවැයගත ආදායම්, වියදම් හා බැරකම් හතකට අදාල සංඛ්‍යා ඒවාට අදාල තථ්‍ය සංඛ්‍යා සමඟ සැසඳීමේදී සියයට 35 සිට සියයට 409 දක්වා වූ පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින්වර රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට යොමු කරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | විධිමත් පරිදි ලෙජර් ගිණුම් පද්ධතියක් පවත්වා ගෙන යාමට කටයුතු කර නොතිබීම හා උපචිත පදනම මත ගිණුම් පිළියෙල නොකිරීම. |
| (ආ) ත්‍යාග ගණනය කිරීම | ත්‍යාග මුදල් ගණනය කිරීමේදී රජයේ බදු ආදායම සුරක්ෂිත වන ලෙසටත්, රේගු බදු වංචාවන්වල පාලනයක් ඇති වන ලෙසටත් හා රේගු බදු වංචාවන්වල නිරත පාර්ශවයන්ට උපරිම අවාසියක් ලැබෙන ලෙසටත් වූ ප්‍රායෝගික ගණනය කිරීමේ ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබීම. |
| (ඇ) ත්‍යාග ගෙවීම් කිරීම | ගිණුම් අංශය වෙත ත්‍යාග ගොනු ලද අවස්ථාවේදී එම ගොනු ලේඛනගත නොකිරීම හා අනුපිළිවෙල අනුව ගෙවීම් නොකිරීම. |